# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2011 අංක 14 දරන හරබදු (ඉවත් කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 2.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2011 අංක 14 දරන හරබදු (ඉවත් කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු 31 වන දින]

එල්.ඩී.—ඕ. 18/2011

**2002 අංක 16 දරන හරබදු පනත ඉවත් කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2011 අංක 14 දරන හරබදු (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) 2002 අංක 16 දරන හරබදු පනත, 2011 මාර්තු මස 31 වන දින සිට බලාත්මක වන පරිදි ඉවත් කරන ලද සේ සලකනු ලැබේ. ඉවත් කිරීම සහ ඉතිරි කිරීම.

(2) එම ඉවත් කිරීම නොතකා මෙම පනතේ විධිවිධාන (3) වන උප වගන්තියේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට වසර තුනක කාලයක් සඳහා බලාත්මකව පැවැතිය යුතු ය.

(3) 2011 මාර්තු මස 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2002 අංක 16 දරන හරබදු පනත ඉවත් කිරීම නොතකා:—

(අ) 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ පනවනු ලැබූ හර බද්ද (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවුරුදු තුනක කාලසීමාව ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනය ඉකුත් වන දිනය දක්වා, එම ඉවත් කරන ලද පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව සෑම වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින්ම එකතු කළ යුතු අතර, එම සෑම බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක විසින්ම එසේ හරබදු ලෙස ලබාගන්නා ලද සියලු මුදල්, ඉවත් කරනු ලැබූ පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය; සහ

(ආ) 2002 අංක 16 දරන හරබදු පනත ඉවත් කිරීමට පෙරාතුව එම පනතේ විධිවිධාන යටතේ ගොනු කරන ලද යම්

2—PL 005609—3,350 (2011/03)

නඩුකරයක්, නීතිකෘත්‍යක් හෝ කාරණයක් එම පනත ඉවත් කිරීම නොතකා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි එම නඩුකරය, නීතිකෘත්‍ය හෝ කාරණය අවසන් වන තෙක් නොකඩව පවත්වාගෙන යා යුතු ය:

එසේ වුව ද, 2 වන වගන්තියේ (2) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති වසර තුනක කාල සීමාව, එම වසර තුනක කාල සීමාව අවසන් වන විට අවසන් කර නොමැති ඉවත් කරන ලද පනත යටතේ ගොනු කරන ලද යම් නඩුකර, නීතිකෘත්‍ය හෝ කාරණා සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.